# ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුර

1996 අංක 26 දරන බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනතේ 61(1)(ඈ) පරිදි පාලක සභාව විසින් පනවන ලද ශිෂ්‍යයන්ගේ පදිංචිය පිළිබඳව සම්පාදිත අතුරු ව්‍යවස්ථා.

## නේවාසිකව සිටින භික්ෂූන් වහන්සේලා විසින් පිළිපැදිය යුතු නීතිරීති.

01. නේවාසික පහසුකම් සපයා ඇති ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා විශ්වවිද්‍යාලයට පැමිණීම නියම කළ දිනයේ දී නේවාසිකාගාරයට පැමිණිය යුතුය. එසේ දැනුම් දෙන ලද දිනයේ සිට දින 07 ක් ඇතුළත නොපැමිණෙන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ නමක් වෙනුවට වෙනත් අය ඇතුළත් කිරීමට විධිවිධාන යොදනු ඇත. දැනුම් දෙන දිනයේ සිට වලංගු වන පරිදි නේවාසිකාගාර ගාස්තු සම්පූර්ණයෙන්ම ගෙවිය යුතුය. නේවාසිකාගාරයට තෝරා ගන්නා ලද නමුත්, නේවාසික ගාස්තු සම්පූර්ණයෙන් ගෙවන තෙක් ශාලාවට ඇතුළු කරගනු නොලැබේ.

02. සෑම අධ්‍යයන වර්ෂයක් ආරම්භයේදීම ශාලාධිපති/උපශාලාධිපති ස්වාමීන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් ශිෂ්‍ය භික්ෂු නිවාස කමිටුවක් පත්කරනු ලැබේ. ශිෂ්‍ය භික්ෂූන්ගේ සුභසාධනයට අදාළ කටයුතු පිළිබඳව ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ශාලාධිපති/උපශාලාධිපති ස්වාමීන් වහන්සේට වාර්තා කිරීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම, එම කමිටුවල පරමාර්ථය වේ.

03. සෑම ශිෂ්‍ය භික්ෂු නිවාසයකටම ඇතුළත් වන සියලුම ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා විසින් මෙහි පහත දක්වා ඇති නීතිරීති පිළිපැදිය යුතුය. මෙම නීතිරීති කඩකරන ශිෂ්‍ය භික්ෂූන්ට පහත දැක්වෙන පරිදි දඬුවම් දීමට මහෝපාධ්‍යායයන් වහන්සේට බලය ඇත. නේවාසිකාගාරය පරිහරණය කිරීමේ අයිතිය නියමිත කාලයකට අහිමි කිරීම හෝ සම්පූර්ණයෙන් අහිමි කිරීම හෝ වෙනත් සුදුසු දඬුවමක් දුන් සෑම විටකදීම ඒ බව ශිෂ්‍ය භික්ෂු නමගේ පෞද්ගලික ලිපිගොනුවේ සටහන් කරතැබීම හා භාරකරුවන්ට දැනුම්දීම සිදු කරනු ලබයි.

04. <u>නේවාසිකාගාර නීතිරීති.</u>

4.1 භික්ෂූන් වහන්සේලාට නේවාසිකාගාරයේ කාමර වෙන් කර දෙනු ලබන්නේ ශාලාධිපති/උපශාලාධිපති ස්වාමීන් වහන්සේ විසිනි.

4.2 ශාලාධිපති/උපශාලාධිපති ස්වාමීන් වහන්සේගේ අවසර නොමැතිව කිසිම නේවාසිකයකු අනෙකකු සමග කාමර මාරු නොකළ යුතුය.

4.3 රාත්‍රි 09.00 න් පසු නේවාසිකයෝ තම කාමරවල සිටිය යුතු අතර, ඇතුළුවීමට හෝ පිටවීමට අවසර නොලැබේ. එසේම හැම දෙනාම සියලු කල්හි අන්‍ය භික්ෂූන් වහන්සේලාගේ පෞද්ගලික භාවයට ගරු කළ යුත්තාහ.

4.4 ශාලාධිපති/උපශාලාධිපති ස්වාමීන් වහන්සේගේ අවසරය නොමැතිව අභ්‍යන්තර හෝ බාහිර අමුත්තෙකුට තම කාමරය තුළ ලැගුම් නොදිය යුතුය.

4.5 ශාලාධිපති/උපශාලාධිපති ස්වාමීන් වහන්සේගේ අවසරය නොමැතිව කිසිම නේවාසිකයෙකු එක් කාමරයක බඩු බාහිරාදිය වෙනත් කාමරයකට රැගෙන නොයා යුතුය.

4.6 කාමරවල ලී බඩු අව්-වැසිවලට හසුවන සඳළුතලවල හෝ කාමරවලින් පිටත හෝ නොතැබිය යුතුය.

4.7 නේවාසිකයින් එක් අයෙකුට වැඩි ගණනක් වෙසෙන කාමරයක ඇති චංචල හෝ නිශ්චල දේපලවල ආරක්ෂාව ගැන හැම දෙනාම වෙන් වෙන්ව ද, සාමුහිකව ද, වගකිව යුතුය. නැතිවීම හෝ විනාශවීම හෝ විරූප කිරීම් වෙනුවෙන් දැරීමට සිදුවන වියදම් ඊට වගකිව යුතු ශිෂ්‍ය භික්ෂූන් වහන්සේගෙන් අය කරගනු ලැබේ.

4.8 විශ්වවිද්‍යාලයේ ක්‍රියාත්මක වන දානය සකස් කර ගැනීමේ වැඩපිළිවෙළට ඔබවහන්සේ එකඟ වියයුතුය.

4.9 නේවාසිකයින්ට භාරදෙන ලද කාමර යතුරු හා වෙනත් උපකරණ නිවාඩු කාලය ආරම්භයේදී මෙන්ම නිවාසයෙන් අස් වී යන දිනයේදී ශාලාධිපති/උපශාලාධිපති ස්වාමීන් වහන්සේට භාර දියයුතුය. නේවාසිකාගාරයෙන් අස් වී යන විට ඒ බව ශාලාධිපති/උපශාලාධිපති ස්වාමීන් වහන්සේට දැන්වීම අනිවාර්ය වේ.

ඉහත සඳහන් නීතිරීතිවලට අනුගතව විශ්වවිද්‍යාලයේ නේවාසික පහසුකම් ලැබීමට එකඟ වෙමි.

1. නම - ..................................................................................................................

2. අත්සන - ..................................................................................................................

3. දිනය -..................................................................................................................